ජනාධිපති කාර්යාලය

சனாதிபதி அலுவலகம்

PRESIDENTIAL SECRETARIAT

ජනාධිපති චක්‍රලේඛ අංකය : SP/PCMD/04/16

2016 සැප්තැම්බර් මස 07 වන දින

සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපතිවරුන්,
සියලුම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සම සභාපතිවරුන්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා දින යොදා ගැනීමේ දී ඇති වන අපහසුතා අවම කිරීම**

ජාතික සංවර්ධන සැළසුම්වලට අනුකූලව දිස්ත්‍රික් මට්ටමේ දී හා ප්‍රාදේශීය මට්ටමේ දී රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල වගකීම වන අතර, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සම සභාපතිත්වය කිහිප දෙනෙකු විසින් දරණ බැවින්, සම්බන්ධීකරණ කමිටු රැස්වීම් සඳහා ඔවුන් සියලු දෙනාගේම එකඟතාවය මත දිනයක් වෙන් කර ගැනීමේ දී, දේශපාලන අධිකාරිය මෙන්ම රාජ්‍ය නිලධාරීන්ද අපහසුතාවයට පත්වන බවත් එසේ හෙයින් සම්බන්ධීකරණ කමිටු රැස්වීම්, විධිමත් ආකාරයෙන් පැවැත්වීමට නොහැකි බවත්, අතිගරු ජනාධිපතිතුමන් විසින් නිරීක්ෂණය කර ඇත.

එම තත්ත්වය අවම කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා නිශ්චිත දිනයක් නියම කරන අතර, ඒ අනුව සෑම මසකම දෙවන සඳුදා දිනයන් හි දී ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම ද, සෑම මසකම සිව්වන සඳුදා දිනයන් හි දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම ද පැවැත්වීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි මින් දැනුම් දෙමි.

තව ද, දෙවන සඳුදා දින රජයේ නිවාඩු දිනයක් වන්නේ නම්, පළමු සඳුදා දින ද, සිව්වන සඳුදා දින රජයේ නිවාඩු දිනයක් වන්නේ නම්, තෙවන සඳුදා දින ද, අදාළ සම්බන්ධීකරණ කමිටු රැස්වීම පැවැත්වීමටත්, යම් සම සභාපතිවරයෙකු, තමා සම සභාපතිත්වය දරණ සම්බන්ධීකරණ කමිටු සංඛ්‍යාව දෙක(02)ට වඩා වැඩි වන විට, අනෙකුත් සම සභාපතිවරුන් සමඟ සාකච්ඡා කොට සුදුසු දිනයක් යොදා ගැනීම, අදාළ සම සභාපතිවරයාගේ වගකීමක් බවත්, අතිගරු ජනාධිපතිතුමා අවධාරණය කර ඇත.

2016 වර්ෂයේ සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා සහ 2017 වර්ෂය සඳහා, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම සඳහා ඇමුණුම - Iහි සඳහන් දිනයන් හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම සඳහා ඇමුණුම - II හි සඳහන් දිනයන් යොදා ගැනීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

ඒ අනුව, සම්බන්ධීකරණ කමිටු තුළින් අපේක්ෂිත කාර්ය භාරය නොපිරිහෙලා ඉටු කිරීම සඳහා ඔබ කැපවීමෙන් කටයුතු කරනු ඇතැයි යන්න අතිගරු ජනාධිපතිතුමාගේ අපේක්ෂාව බවද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

පී.බී.අබේකෝන්
ජනාධිපති ලේකම්

පිටපත - ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස
ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.

ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

ඇමුණුම I

## 2016 වර්ෂය සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම සඳහා යෝජිත දිනයන්

| මාසය | දිනය |
|---|---|
| සැප්තැම්බර් | 05 |
| ඔක්තෝබර් | 10 |
| නොවැම්බර් | 07* |
| දෙසැම්බර් | 05* |

## 2017 වර්ෂය සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම සඳහා යෝජිත දිනයන්

| මාසය | දිනය |
|---|---|
| ජනවාරි | 09 |
| පෙබරවාරි | 13 |
| මාර්තු | 13 |
| අප්‍රේල් | 03* |
| මැයි | 08 |
| ජූනි | 12 |
| ජූලි | 10 |
| අගෝස්තු | 14 |
| සැප්තැම්බර් | 11 |
| ඔක්තෝබර් | 09 |
| නොවැම්බර් | 13 |
| දෙසැම්බර් | 11 |

* දෙවන සඳුදා රජයේ නිවාඩු දිනයන් බැවින්, පළමු සඳුදා දිනයන් යොදා ඇත.